# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2101/16 - 2018 දෙසැම්බර් මස 11 වැනි අඟහරුවාදා - 2018.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නිවේදන අංක 1

**(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත**

ශ්‍රී පාද වන්දනා වාරය - 2018/2019

ඉහත සඳහන් වන්දනා සමය 2018 දෙසැම්බර් මස 21 වැනි දින සිට 2019 මැයි මස 19 දින දක්වා පවත්වන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව පහත සඳහන් *ගැසට් පත්‍රවල* ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි වන්දනා සමය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක්කරමි.

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859 දරන ගැසට් පත්‍රය

1949 ජූලි මස 22 දාතම හා අංක 10000 දරන ගැසට් පත්‍රය

1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255 දරන ගැසට් පත්‍රය

1961 ජූලි මස 07 දාතම හා අංක 12508 දරන ගැසට් පත්‍රය

1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 දරන ගැසට් පත්‍රය

2017 සැප්තැම්බර් මස 01 දාතම හා අංක 2034/33 දරන ගැසට් පත්‍රය

මාලනී ලොකුපෝතාගම,
රත්නපුර දිස්ත්‍රික් ලේකම්/දිසාපති.

2018 දෙසැම්බර් මස 10 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

නිවේදන අංක 2

**ශ්‍රී පාද වන්දනා වාරය - 2018/2019**

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859 දරන *ගැසට් පත්‍රය*, 1949 ජූලි මස 22 දාතම හා අංක 10000 දරන *ගැසට් පත්‍රය*, 1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255 දරන *ගැසට් පත්‍රය*, 1961 ජූලි මස 07 දාතම හා අංක 12508 දරන *ගැසට් පත්‍රය*, 1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 දරන *ගැසට් පත්‍රය* සහ 2017 සැප්තැම්බර් මස 01 දාතම හා අංක 2034/33 දරන *ගැසට් පත්‍රය* යන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රවල* පළවූ වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

**01. විශ්‍රාම ශාලා/අම්බලම් යනු**

1.1 ලිහිණිහෙල, පලාබද්දල විහාරස්ථානය, හැරමිටිපාන, ආඬියාමලතැන්න, වර්ණගල, සීතගඟුල, මැදහින්න, ඉදිකටුපාන යන විශ්‍රාම ශාලා/අම්බලම් නවාතැන් ලෙස භාවිතා කළ යුතු ය.

1.2 තාවකාලික නවාතැන් සකස් කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

**02. ගොඩනැගිලි ඉදිකිරීම**

මාගෙන් හෝ බලය ලත් නිලධාරියකුගේ ලිඛිත අවසරයකින් තොරව කිසිවකු විසින් හෝ 2018 දෙසැම්බර් මස 21 දින සිට 2019 මැයි මස 19 දින දක්වා කාලය තුළ ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ නවාතැනක් හෝ වෙළඳසලක් ඉදිකිරීම නොකළ යුතු ය.

**03. යාචකයෝ**

සිරිපා මළුව ප්‍රදේශයේ හෝ අම්බලම්/විශ්‍රාම ශාලා ප්‍රදේශයේ කිසිම තැනකදී යාචකයන් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීමද කිසිවකු විසින් හිඟමන් දීම හෝ බෙදාදීමද නොකළ යුතු ය.

**04. නෑම සහ සේදීම**

4.1 දැනටමත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය සහ පළාත් පාලන ආයතන මඟින් හඳුනාගෙන නම්කර ඇති ආරක්ෂිත ස්ථාන වලදී හැර දිය නෑම හෝ රෙදි සේදීම නොකළ යුතු ය.

4.2 පෞද්ගලික ආයතන මගින් දියනෑම හෝ රෙදි සේදීම සඳහා පහසුකම් සැලසීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතනය සහ මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් විධිමත් පූර්ව ලිඛිත අවසරයක් ලබා ගත යුතු ය.

**05. වාහන/ගමන් මාර්ග**

5.1 ප්‍රාදේශීය සභාව හෝ අදාළ පළාත් පාලන ආයතනය විසින් වෙන්කර ඇති ස්ථාන වල හැර වෙනත ස්ථාන වල වාහන ගාල් කිරීම හෝ ඇතුළු කිරීම නොකළ යුතු යි.

5.2 වන්දනා සඳහා වෙන්කර ඇති මාර්ග වල හැර වෙනත් විකල්ප මාර්ග සකස් කිරීම හෝ භාවිතා කිරීම නොකළ යුතු යි.

**06. පරිසරය හා සනීපාරක්ෂාව**

6.1 වන්දනා මාර්ගයේ හෝ සිරිපා මළුව පරිශ්‍රයේ හෝ විශ්‍රාම ශාලා අවට හෝ පරිසරයට පොලිතින්, ප්ලාස්ටික් අවිධිමත් පරිදි පරිසරයට බැහැර කිරීම නොකළ යුතු යි.

6.2 ශ්‍රී පාද අඩවිය තුළ කිසිම හේතුවක් නිසා ගින්නක් ඇතිවන ආකාරයේ ගිනි මැල සැකසීම හෝ ගිනි දැල්වීම සිදු නොකළ යුතු ය.

6.3 වන්දනා වාරය තුළ බැතිමතුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැලසීම හා අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු පළාත් පාලන ආයතන වලට හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පවරමි.

**07. වෛද්‍ය පහසුකම්**

පෞද්ගලික ආයතන මගින් පැවැත්වීමට අදහස් කරනු ලබන වෛද්‍ය ප්‍රතිකාර/ප්‍රථමාධාර මධ්‍යස්ථාන සඳහා පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකගේ සහ පළාත් පාලන ආයතනයේ පූර්ව ලිඛිත අවසරයන් ලබාගත යුතු යි.

**08. වෙළඳාම සහ දන්සැල්**

8.1 සිරිපා මළුව, විශ්‍රාම ශාලා ප්‍රදේශයන් හි සංචාරක වෙළඳාම තහනම්ය.

8.2 මවිසින් හෝ බලයලත් නිලධාරියකු විසින් අවසර දුන් ස්ථාන වල හැර පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය අලෙවි නොකළ යුතු යි.

8.3 මත්පැන්, දුම්වැටි හෝ වෙනත් කිසිදු මත්ද්‍රව්‍යයක් ගමන් මාර්ග වල රැගෙනයාම හෝ වෙළඳසැල් වල, තබා ගැනීම, විකිණීම, මිලදී ගැනීම හෝ භාවිතා කිරීම සපුරා තහනම්ය.

8.4 පිවිසුම් මාර්ගයන්හි දෙපස අවසර දී ඇති ස්ථාන වල හැර කිසිදු ස්ථානයක තාවකාලික හෝ ස්ථිර වෙළඳසල් තැනීම හෝ පවත්වාගෙන යාම හෝ වෙළඳාම් කිරීම නොකළ යුතු ය.

8.5 සෑම වෙළඳසලකම සෑම ගොඩනැගිල්ලකම කසළ බඳුන් තැබිය යුතු අතර අපද්‍රව්‍ය සියල්ල එහි බහාලිය යුතු ය.

8.6 විකිණීමට තබා ඇති සියළු සකස්කළ ආහාර ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිතව රඳවා තැබිය යුතු ය.

8.7 දන්සැල් ලබාදෙන බැතිමතුන් විසින් ඒ සඳහා මාගේ හෝ බලයලත් නියෝජිතයකුගේ පූර්ව ලිඛිත අවසරයක් ලබාගත යුතු ය.

මාලනී ලොකුපෝතාගම,
රත්නපුර දිස්ත්‍රික් ලේකම්/දිසාපති.

2018 දෙසැම්බර් මස 10 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

12 - 749

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.